1978 - 2 - 11

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 5 දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 පෙබරවාරි මස 2 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 පෙබරවාරි මස 03 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ
II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 30 යි. තැපැල් ගාස්තුව : ශත 15 යි.

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 5 දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 පෙබරවාරි මස 2 වන දින]

එල්.ඩී.—ඕ. 6/78

## පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**කෙටි නාමය.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 5 දරන පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**383 වන අධිකාරයේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියෙහි (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2) මේ පනතේ උපලේඛනයෙහි ('අ' කොටසේ හෝ 'ආ' කොටසේ හෝ වුව ද) දැක්වෙන පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ සෑම කඩකිරීමක් ම, ජාතික රාජ්‍ය සභාව විසින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් හෝ තත් කාර්යය සඳහා මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධාන යටතේ දඬුවම් කරනු ලැබිය හැකි, මේ කොටස යටතේ වූ වරදක් විය යුතු ය.";

(ආ) ඒ වගන්තියෙහි (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියෙහි 27 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) (1අ) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මේ පනතේ උපලේඛනයෙහි ('අ' කොටසේ හෝ 'ආ' කොටසේ හෝ වුව ද) දැක්වෙන පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ යම් කඩ කිරීමක් සම්බන්ධයෙන් ලඝු ආකාරයෙන් දඬුවම් කිරීමට ජාතික රාජ්‍ය සභාවට බලය සහ අධිකරණ බලය තිබිය යුතු ය.";

2—ඒ 28250—14,274 (78/02)

(ආ) ඒ වගන්තියෙහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) 22 වන වගන්තියෙන් හෝ 27 (1) වන වගන්තියෙන් හෝ පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා, ජාතික රාජ්‍ය සභාව ඉදිරියේ හෝ එහි යම් කාරක සභාවක් ඉදිරියේ පැවැත්වෙන කටයුතුවල දී යම් සාක්ෂියක ආවේශ්‍යතාව පිළිබඳ ප්‍රශ්නයක් පැන නැගෙන අවස්ථාවක, මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු කටයුතුවල දී අදාළ වන සාක්ෂි පිළිබඳ නීතියට අනුකූලව එම ප්‍රශ්නය නිශ්චය කළ යුතු ය." ; තව ද

(ඇ) ඒ වගන්තියෙහි පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන අලුත් පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"උපලේඛනයෙහි 'අ' කොටසේ සහ 'ආ' කොටසේ දැක්වෙන වැරදි පිළිබඳ ජාතික රාජ්‍ය සභාවේ අධිකරණ බලය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 27අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. පහත දැක්වෙන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ වන වගන්තිය ලෙස බලපැවැත් විය යුතු ය :—

"පැමිණෙන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට ජාතික රාජ්‍ය සභාවට ඇති බලය සහ එය පැහැර හැරීමේ ප්‍රතිවිපාක.

27අ. (1) 27 වන වගන්තිය ප්‍රකාර ජාතික රාජ්‍ය සභාව වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, ජාතික රාජ්‍ය සභාව විසින් හෝ ඒ සභාව විසින් විධිමත් ලෙස බලය දෙනු ලැබූ එහි යම් කාරක සභාවක් විසින්, ඒ සභාව ඉදිරියට හෝ කාරක සභාව ඉදිරියට පැමිණෙන ලෙස නැතහොත් පැමිණ තම සන්තකයෙහි හෝ තමාගේ පාලනය යටතේ ඇති යම් ලියවිල්ලක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි අතර ඒ තැනැත්තා විසින් ඒ නියමය පිළිපැදිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරින ලද අවස්ථාවක, වේත්‍රධාරියා විසින් හෝ ජාතික රාජ්‍ය සභාවේ යම් නිලධරයකු විසින් නැතහොත්, අවස්ථාවෝචිත පරිදි කථානායකවරයා විසින් හෝ ඒ කාරක සභාවේ සභාපතිවරයා විසින් හෝ බලය දෙන ලද යම් පොලිස් නිලධරයකු විසින් ඒ තැනැත්තා සිරභාරයට ගනු ලැබීමට යටත් වන අතර එසේ සිරභාරයට ගනු ලැබූ විට, එසේ සිර භාරයට ගනු ලැබූ තැනැත්තා, අවස්ථාවෝචිත පරිදි, ජාතික රාජ්‍ය සභාව වෙත හෝ එම කාරක සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තව ද

ඒ සභාව විසින් හෝ කාරක සභාව විසින් ඒ තැනැත්තා කොළඹ අධිකරණ කලාපය ඇතුළත මුල් අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කරන ඉහළම අධිකරණයේ පිස්කල්වරයාගේ අත් අඩංගුවේ රිමාන්ඩ් කර තැබීම හෝ ජාතික රාජ්‍ය සභාව විසින් හෝ ඒ කාරක සභාව විසින් නිශ්චය කරනු ලබන නියම මත එම තැනැත්තා මුදා හැරීම හෝ කරනු ලැබිය හැකි ය.".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— *ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

*"ජාතික රාජ්‍ය සභාව විසින් නියම කරනු ලැබිය හැකි දඬුවම.*

28. (1) මේ පනතේ උපලේඛනයෙහි 'අ' කොටසේ දැක්වෙන යම් වරදක් සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාව විසින් නියම කරනු ලැබිය හැකි දඬුවම නම් අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක් හෝ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයක් හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකම හෝ විය යුතු ය.

(2) මේ පනතේ උපලේඛනයෙහි 'ආ' කොටසේ දැක්වෙන යම් වරදක් සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාව විසින් නියම කරනු ලැබිය හැකි දඬුවම නම් සභාගැබ සීමාවට කැඳවා අවවාද කිරීම හෝ සභා භූමියෙන් ඉවත් කිරීම හෝ විය යුතු ය.

(3) මන්ත්‍රීවරයකු විසින් කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විටක, මෙහි මින් පෙර දැක්වුණු යම් දඬුවමකට අමතරව හෝ යම් දඬුවමක් වෙනුවට, එක් මාසයක් නොඉක්මවන යම් කාලයක් තුළ ජාතික රාජ්‍ය සභාවේ සේවය කිරීමෙන් ඔහු අත්හිටුවීමේ නියමයක් ජාතික රාජ්‍ය සභාව විසින් කරනු ලැබිය හැකි ය.

(4) ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු නොවන තැනැත්තකු විසින් කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විටක, හය මාසයක් නොඉක්මවන කාලයක් තුළ ජාතික රාජ්‍ය සභාවට හෝ එහි භූමියට හෝ ඇතුළුවීම එම තැනැත්තාට තහනම් කළ යුතු යයි නියම කිරීම ද ජාතික රාජ්‍ය සභාව විසින් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" ජාතික රාජ්‍ය සභාව විසින් නියම කරනු ලබන දඬුවමක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියම කරනු ලබන දඬුවමක් ලෙස ක්‍රියාත්මක කළ යුතු බව.

32. මේ පනතේ 28 වන වගන්තිය යටතේ ජාතික රාජ්‍ය සභාව විසින් නියම කරනු ලබන යම් දඬුවමක්, එය මේ පනතේ 23 වන වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියම කරන ලද දඬුවමක් වූවාක් මෙන්, පමුණුවා ක්‍රියාත්මක කළ යුතු අතර අදාළ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කළ යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනයේ 'අ' කොටස සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි උපලේඛනයේ 'අ' කොටසේ සඳහන් ශීර්ෂ පාඨය වෙනුවට පහත දැක්වෙන අලුත් ශීර්ෂ පාඨය ආදේශ කිරීමෙන් ඒ කොටස මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" ජාතික රාජ්‍ය සභාව විසින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කළ හැකි වැරදි. ".